සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

10 ශ්‍රේණිය

# ඉස්ලාම් ධර්මය

කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ පදනම වනුයේ,

(1) ඊමාන් (2) අමල් (3) ඉබාදත් (4) සලාත්

02 අස්සම්ඉයියාත් හි ඇතුළත් අංගයකි,

(1) නුබුව්වත් (2) රිසාලත් (3) සිරාත් (4) කද්ර්

03 ඊමාන් සහ අමල් බෙදා වෙන් කළ නොහැකි බව සඳහන් සූරාව,

(1) සූරා නස්ර් (2) සූරා අස්ර් (3) සූරා නිසා (4) සූරා තාහා

04 කිතාබ් සහ සුහුෆ් ප්‍රදානය කරනු ලැබුවේ,

(1) දාවුද් නබි (2) ඊසා නබි (3) මුහම්මද් නබි (4) මූසා නබි

05 ධනය හා සම්බන්ධ ඉබාදතයක් වන්නේ,

(1) දික්ර් (2) සලාත් (3) සව්ම් (4) උල්හියියා

06 ජලයේ ස්වභාවික ගුණය වෙනස් වූ ද්‍රාවන අයත් වන්නේ,

(1) අල් මාඋත් තහුර් (2) අල් මාඋත් තාහිර්

(3) අල් මාඋත් නජිස් (4) අල් මාඋත් මුස්තඃමල්

07 බිය බැතිය හා යටහත්භාවය හඟවන අරාබි පද වනුයේ,

(1) කුෂුඋ කුලුඋ (2) හව්ෆ් රාජාඋ

(3) තක්වා සුහුද් (4) ඉහ්ලාස් වරඋ

08 නබි (සල්) තුමා විසින් මරණාසන්න මොහොතේදී සමූහයට වසියියත් කරන ලද වගකීම.

(1) සලාත් (2) zසකාත් (3) සව්ම් (4) හජ්

09 පළමු අන්තහියියාත් හිඳුම් ක්‍රමය වන්නේ,

(1) තවර්රුක් (2) ඉෆ්තිරාෂ් (3) ඉත්ලාක් (4) ඉඃතිදාල්

10 අයාතුල් කුර්සි හි අඩංගු ආයත් ප්‍රමාණය

(1) එකකි. (2) හයකි. (3) අටකි. (4) දහයකි.

11 සුබහ් සහ මග්රිබ් සලාතයන්ට පසුව දස වසරක් පරායනා කළ යුතු කලිමාව,

(1) ෂහාදා (2) තම්ජීත් (3) තව්හීද් (4) රද්දුල් කුෆ්ර්

12 තැන්පත් හා නිර්මල සිත හඳුන්වන අරාබි පදය,

(1) නෆ්සුල් අම්මාරා (2) නෆ්සුල් ලව්වාමා

(3) නෆ්සුල් මුතමඉන්නා (4) තස්කියතුන් නෆ්ස්

13 නබි (සල්) තුමා තම කුළුදුල් දේශනය පැවැත්වූ ස්ථානය,

(1) අරෆා පිටිය (2) සෆා කන්ද (3) හිරා ගුහාව (4) කෑබතුල්ලාව

14 ''ජාමිඋල් කුර්ආන්'' යන විරුදාවලියට පාත්‍ර වූ කලීෆාවරයා,

(1) අබු බක්කර් (රලි) (2) උමර් (රලි)

(3) උස්මාන් (රලි) (4) අලි (රලි)

15 ජාහිලියියා සමයේ පැවති තාවකාලික විවාහ ක්‍රමය,

(1) ලිහාර් (2) ලිආන් (3) ඊලාඋ (4) මුත්තා

16 මුජ්තහිද්වරු බහුතරයක් කිසියම් නිගමනයකට පැමිණි අවස්ථාවක සෙසු අය කිසිවක් නොකියා සිටීම.

(1) ඉජ්මා සුකුති (2) ඉජ්මාඋස් සරීහ්

(3) ඉජ්මා මුරක්කබ් (4) ඉජ්මා අක්සරියියා

17 නබි (සල්) තුමාණන් මක්කා පුරවරයේ දෑවා ප්‍රචාරය සිදුකළ වසර ගණන,

(1) 63 කි. (2) 53 කි. (3) 13 කි. (4) 23 කි.

18 කාන්තාවන් රන් ආභරණ පැළඳීම,

(1) හරාම් (2) මක්රූහ් (3) ජාඉස් (4) සුන්නත්

19 වානේ කර්මාන්තයේ නියැලී සිටි නබිවරයා,

(1) නුහ් නබි (2) මුසා නබි (3) ආදම් නබි (4) දාවුත් නබි

20 කියාස්හි රුකුන්වල ආගමික විසඳුම් සඳහන් කරන පදය,

(1) අස්ල් (2) ෆර්උ (3) හුකුම් (4) ඉල්ලත්

21 මුස්ලිම් වර්ෂය ගණනය කිරීම සඳහා පාදක වූ සිද්ධිය,

(1) නබි (සල්) තුමාගේ උපත (2) හිජ්රත් ගමන

(3) මිහ්රාජ් ගමන (4) නබි (සල්) තුමාගේ විපත

22 ගෙතුම් වැඩ වලින් ජීවිකාව සලසා ගත් උම්මහාතුල් මුඃමිනීන්වරිය,

(1) හෆ්සා (රලි) (2) සව්දා (රලි) (3) සෙයිනබ් (රලි) (4) ජුවෛරියා(රලි)

23 හුදෙයිබියා ගිවිසුම ඇතිකර ගත් වර්ෂය,

(1) ක්‍රි. ව. 625 (2) ක්‍රි. ව. 626 (3) ක්‍රි. ව. 630 (4) ක්‍රි. ව. 600

24 අපායේ පතුලේ සිටින්නන් ලෙස අල්කුර්ආනයේ සඳහන් වන්නේ,

(1) මුනාෆික් (2) මුර්තද් (3) මුෂ්රික් (4) මුල්හිද්

25 පොළොව සරුසාර කරන කර්තව්‍යය හඳුන්වනු ලබන පදය,

(1) ඉබාදත් (2) ඉමාරත් (3) කිලාෆත් (4) ජිනායත්

26 අල්ලාහ්ගෙන් පව් සමාව අයැදින දික්රය,

(1) අල්ලාහු අක්බර් (2) අස්තඃෆිරුල්ලාහ්

(3) අල්හම්දු ලිල්ලාහ් (4) සුබහානල්ලාහ්

The National e-learning Portal for The General Education

27 මුහම්මද් නබි (සල්) තුමා මදීනා, සම්මුතිය ඇතිකර ගත්තේ කවුරුන් සමඟද ?

(1) යුදෙව්වරු (2) කුරෛෂිවරු (3) කස්රජ්වරු (4) මජුසිවරු

28 මන්නු සල්වා යනු,

(1) ධජයකි (2) තරුවකි (3) ආභරණයකි (4) ආහාරයකි

29 සින්ද් රාජ්‍යය ජයග්‍රහණය කළ මුස්ලිම් සෙන්පතියා,

(1) තාරික් බින් සියාද් (2) මුහම්මද් බින් කාසිම්

(3) කාලිද් ඉබ්නු වලීද් (4) අබ්දුල් රහුමාන්

30 වරකත් බින් නෞෆල් යනු අරාබියේ විසූ,

(1) කවියෙකි. (2) වීරයෙකි. (3) පූජකවරයෙකි. (4) පඬිවරයෙකි.

31 අරාබිකරයට නැගෙනහිරින් මායිම්ව පිහිටා ඇත්තේ,

(1) පර්සියාව (2) සිරියාව (3) රතු මුහුද (4) අරාබි මුහුද

32 ප්‍රථම හිජ්රත් ගමන සිදු වූ වර්ෂය,

(1) නුබුව්වත් 3 (2) නුබුව්වත් 4 (3) නුබුව්වත් 5 (4) නුබුව්වත් 7

33 නබි (සල්) තුමා මදීනාවේ ඉදිකළ මස්ජිදය,

(1) මස්ජිදුල් හරම් (2) මස්ජිදුන් නබවි

(3) මස්ජිදුල් අක්සා (4) මස්ජිදුන් නමීරා

34 ආර්ථික ක්‍රියාකාරකම් ඇතුලත් අංශය

(1) මුනාකහාත් (2) අත්තහාරත් (3) ඉබාදත් (4) මුආමලාත්

35 පරලොවේදී නබිවරු සමඟ සිටීමේ භාග්‍ය හිමිවන්නේ,

(1) සෙන්පතියා (2) අවංක වෙළෙනදා

(3) දානපතියා (4) ආලිම්වරයා

36 දැනට ක්‍රියාත්මක වන හිජ්රි අවුරුද්ද,

(1) 1435 (2) 1436 (3) 1437 (4) 1438

37 බාර වීම සඳහා අනුමත දෑ,

(1) ෆර්ල් වූ ක්‍රියා (2) සුන්නත් ක්‍රියා

(3) හරාම් වූ ක්‍රියා (4) ජාඉස් වූ ක්‍රියා

38 ''සියතින් උපයා අනුභව කරනවාට වඩා වෙන කිසිඳු උසස් ආහාරයක් කිසිවක් අනුභව නොකරති '' ඇතුළත් හදීස් මූලාශ්‍රය,

(1) බුහාරි (2) තිර්මිදි (3) අහමද් (4) නසාඊ

39 වෙළෙන්දා වෙළඳ භාණ්ඩයක් විකුණූ බව දන්වන පදය,

(1) ඊජාබ් (2) කබූල් (3) රහ්න් (4) ඉජාරා

40 ''ඔබේ දරුවන්ට පිහිනීමටත්, ඊ විදීමටත්, අශ්වයන් පිට යාමටත් පුරුදු කරන්න'' යනුවෙන් අනුශාසනා කළේ,

(1) ලුක්මාන් (අලෛ) තුමා (2) හසනුල් බසරි (රහ්) තුමා

(3) අලි (රලි) තුමා (4) මුහම්මද් නබි (සල්) තුමා

(ල. 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. තෝරාගත් තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු ලියන්න

(1) අල්කුර්ආනයේ යහගුණ හා සදාචාරයේ වැඩි වශයෙන් පවසන සූරා දෙක කුමක්ද ?

(2) ඊමානයේ ප්‍රධාන කොටස් දෙක කවරේද ?

(3) ඉජ්තිහාද් කරන්නා කෙසේ හඳුන්වයිද ?

(4) ඉස්ලාමයේ ද්විතීය නීති මූලාශ්‍රයන් 02 ක් සඳහන් කරන්න.

(5) ෂිර්ක් හි දෙආකාරය නම් කරන්න.

(6) ඉස්ලාමීය ආර්ථිකයේ තහනම් වූ පොලිය හඳුන්වනු අරාබි පදය කුමක්ද ?

(7) ෆර්ල් හි කොටස් නම් කරන්න.

(8) ජබීරත් යනු කුමක්ද ?

(9) කස්රු කළ නොහැකි සලාතයන් කවරේද ?

(10) ජනාසාව සඳහා කළ යුතු යුතුකම් පිළිවෙලින් ලියන්න. (2 x 10 = 20)

02 (1) ඉල්මුල් අකීදා බිහිවීමට පාදක වූ සාධක කවරේද ? (ල. 02)

(2) නබි (සල්) තුමා සඳහන් කළ ඊමානයේ ඉහළම හා පහළම අංශ 02 කවරේද ? (ල. 03)

(3) මූලික ඉබාදත් අනිවාර්ය කිරීමේ අරමුණු 05 ක් ලියා දක්වන්න. (ල. 05)

03 (1) අල් මාඋත් තහුර් හා අල් මාඋත් තාහීර් අතර ප්‍රධාන වෙනස සඳහන් කරන්න (ල. 02)

(2) දඩි නජිස් පිරිසිදු කරන ආකාරය ලියා දක්වන්න. (ල. 03)

(3) සලාතය නිවැරදිව ඉටුකරන මුඃමින් මෙලොව හා පරලොවෙහි ඇතිකරගන්නා ප්‍රයෝජන 05 ක් ලියන්න. (ල. 05)

04 (1) තව්බාහි කොන්දේසි ලියා දක්වන්න (ල. 02)

(2) වහී පහළ කරන ක්‍රම 03 ක් ලියා දක්වන්න. (ල. 03)

(3) අල්කුර්ආනය ගොනු කිරීමේ කාර්යට දායක වූ සහාබාවරු පස් දෙනෙකු නම් කරන්න. (ල. 05)

05 (1) අර්කානුල් කියාස් නම් කරන්න (ල. 02)

(2) ඉස්ලාම් පිළිගැන්වූ මානව අයිතිවාසිකම් 06 ක් සඳහන් කරන්න. (ල. 03)

(3) තරුණ වියේදී දිනපතා යෙදීමට කාලය වෙන්කළ යුතු අධ්‍යාත්මික ක්‍රියාකාරකම් 05 ක් ලියන්න. (ල. 05)

06 (1) ''වසතියා'' යනු කුමක්ද ? (ල. 02)

(2) වෙළඳාමෙහි මූලික කරුණු කවරේද ? (ල. 03)

(3) වෙළඳ ගනුදෙනු වලදී තහනම් කළ කරුණු 05 ක් සඳහන් කරන්න. (ල. 05)

07 (1) එකල අරාබි මිනිසුන්ගේ පැවති යහපත් ගතිගුණ 04 ක් ලියන්න. (ල. 02)

(2) ජාහිලියියා සමයේ කාන්තාවන්ට හිමි කාර්යයන් 06 ක් සඳහන් කරන්න. (ල. 03)

(3) මක්කාවේ ඉස්ලාම් ව්‍යාප්තිය මර්ධනය කිරීමට කුරෛෂ් කාෆිර්වරු අනුගමනය කළ ක්‍රියා මාර්ගයන් සඳහන් කරන්න. (ල. 05)

(10 x 4 = 40)